Allianz



# අලියාන්ස්
# ෆැමිලි ප්‍රොටෙක්ටර්

## ඔබටත්, ඔබගේ ආදරණීයයන්ටත් සුරක්ෂිත හෙට දිනක්

අලියාන්ස් ලංකා (අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් සහ අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්) යනු, ජර්මනියේ මියුනික් හි ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති, රක්ෂණ හා වත්කම් කළමනාකරණය ආශ්‍රිතව ප්‍රමුඛතම මූල්‍ය සේවා සම්පාදකයකු වන අලියාන්ස් සමූහයෙහි, පූර්ණ හිමිකාරීත්වය දරණ උප සමාගම වේ.

155,000 ක කාර්ය මණ්ඩල ශක්තියෙන් සමන්විත අලියාන්ස්, ලොව පුරා රටවල් 70 කට අධික සංඛ්‍යාවක තනි හා ආයතනික සේවාලාභීන් මිලියන 126 කට පමණ සේවය සලසයි. 2022 වර්ෂයේ ලොව අංක 1 රක්ෂණ සන්නාමය ලෙස නැවතත් පිදුම් ලද අලියාන්ස්, ජීවිත හා සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාරයේ නියැලෙන ජාත්‍යන්තරයේ විශාලතම රක්ෂණ සමාගම් 5 අතුරින් එකකි.

## අලියාන්ස් ෆැමිලි ප්‍රොටෙක්ටර්

ඔබ වඩාත් ආදරයෙන් රැක බලාගන්නේ ඔබේ පවුලේ සාමාජිකයින් බව නොරහසකි. ඔබේ මෙන්ම ඔබේ ආදරණීයයන්ගේ සතුට, ආදරය සහ රැකවරණය වෙනුවෙන් ඔබ ගන්නා උත්සාහය අපමණය. ඔබ සමග එක්ව ඔබේ ආදරණීයයන් වෙනුවෙන් හෙට දවස සුරක්ෂිත කරන්නට අලියාන්ස් අප සූදානම්.

කෙතරම් බාධක, කම්කටොළු මධ්‍යයේ වුවද ඔබගේ පවුලේ සුරක්ෂිතභාවය සාක්ෂාත් කිරීමට කටයුතු කිරීම ඔබ වෙත ඔබ මත පැවරෙන වගකීමක් වන අතරම, මතු අනාගතයේදී යම් අකාරයකින් හෝ සිදුවන අනපේක්ෂිත සිදුවීම් තුළින් ඔවුන්ගේ අනාගතය සුරක්ෂිත කරගැනීම උදෙසා අවැසි සැලසුම් සකස් කිරීම ඔබ විසින් සිදු කළ යුතුව ඇත.

ඒ නිසාම අප 'අලියාන්ස් ෆැමිලි ප්‍රොටෙක්ටර්' රක්ෂණ සැලසුම ඔබ වෙනුවෙන්ම සැලසුම් කරනු ලැබුයේ මෙම නොසිතූ විපත් හේතුවෙන් ඔබට මුහුණ පෑමට සිදුවන තත්ත්වයන් උදෙසා මූල්‍යමය ආරක්ෂණයක් ලබා දීම උදෙසාය.

**මෙම සැලසුම තුළින් ඔබ සහ පවුලේ සාමාජිකයින් හට මුහුණ පෑමට සිදුවන අනපේක්ෂිත සිදුවීම ආවරණය සඳහා ජීවිතාවරණයක් සැලසෙන අතර පවුලේ අභිමතාර්ථයන් ඉටු කර ගැනීම උදෙසා වන ආයෝජනයක්ද අන්තර්ගත වේ.**

## අලියාන්ස් ෆැමිලි ප්‍රොටෙක්ටර් හි සුවිශේෂී ගුණාංග

- රු. 5,000/- ක් වැනි අඩු මාසික වාරිකයකින් ඔප්පුව ආරම්භ කළ හැකි වීම.
- අනපේක්ෂිත වියෝවකදී ආයෝජන ගිණුමේ වටිනාකම සහ රක්ෂිත මුදල යන ද්විත්ව ප්‍රතිලාභයන් ලැබීම.
- පවුලේ සාමාජිකයින් වැඩිවන විට ඔවුන්ද ඔප්පුවට ඇතුලත් කර ගැනීමට හැකිවීම සහ ප්‍රතිලාභ වෙනස් කර ගැනීමට හැකිවීම.
- රක්ෂිත කාලය වසර 10 සිට 30 දක්වා පැවතීම.

- මාසිකව, ත්‍රෛමාසිකව, අර්ධ වාර්ෂිකව හෝ වර්ෂිකව වාරික ගෙවීමේ පහසුකම.
- රක්ෂිතයාගේ අභිමතය පරිදි වාරික ගෙවන ආකාරය සහ වාරිකය වෙනස් කිරීමට ඇති හැකියාව.
- සෑම වසරක් අවසානයේම ආයෝජන ගිණුම සඳහා යෝජිත ආයෝජන ප්‍රතිශතය පිළිබඳව දැනුවත් කිරීම.

## රක්ෂණාවරණය සඳහා ඇතුලත් වීමේ සුදුසුකම්

- අවම වයස : අවුරුදු 18
- උපරිම වයස : අවුරුදු 64
- රක්ෂණය කල් පිරීමේ උපරිම වයස : අවුරුදු 75

ඔබගේ සෞඛ්‍ය තත්ත්වය, ආදායම, රැකියාව, පදිංචිය, චාරිකා, තොරතුරු, ජීවන රටාව යන තොරතුරු සහ පෙර වෛද්‍ය වාර්තා සහ නිර්දේශයන්, රක්ෂණාවරණය ලබාදීම උදෙසා සහ ඒ සඳහා ඇති සුදුසුකම් සලකා බැලීම වෙනුවෙන් ඉල්ලුම් කරනු ඇත.

## මූලික ආවරණයට අමතරව තෝරාගත හැකි අතිරේක ආවරණයන්

- රෝහල් ගතවීම් සඳහා දෛනික දීමනා
- පවුලේ සාමාජිකයින්ගේ සැත්කම් හා රෝහල් වියදම් දීමනා
- අසාධ්‍ය රෝග සඳහා ආවරණය
- හදිසි අනතුරු හේතුවෙන් සිදුවන ජීවිත අහිමිවීම්.
- හදිසි අනතුරු හේතුවෙන් සිදුවන අකර්මණ්‍යතා
- පවුල් ආදායම්
- ආන්තික රෝග සඳහා ආවරණය
- අසාධ්‍ය රෝගයකදී වන්දි මුදලට අමතරව ඉදිරි වාරික ආවරණය
- අවමංගල්‍ය වියදම් ඇතුළු තවත් ආවරණ රැසක්

## ප්‍රතිලාභ ගෙවීම

ජීවිත අහිමිවීමකදී - රක්ෂිත අගය + ආයෝජන ගිණුමේ වටිනාකම
රක්ෂණය කල්පිරීමේදී - ආයෝජන ගිණුමේ වටිනාකම
රක්ෂණ කාලසීමාව තුල - අමතර ප්‍රතිලාභ

## අවම වාරිකය

| ඔප්පුව | මාසික | ත්‍රෛමාසික | අර්ධ වාර්ෂික | වාර්ෂික | වැඩිකළ හැකි අමතර වාරික |
|---|---|---|---|---|---|
| ULE | 5,000 | 9,000 | 18,000 | 36,000 | 5,000 |

Allianz

**අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්**

සමාගම් අංක : PB 3493

25-27 වන මහල, වන් ගෝල්ෆේස් කුළුණ,

අංක 1ඒ, මැද පාර, ගාලු මුවදොර, කොළඹ 02.

දුරකථන : +94 112 300 400

විද්‍යුත් තැපැල : customerservicelife@allianz.lk

වෙබ් අඩවිය : www.allianz.lk

**සැලකිය යුතුයි**

මෙහි එන ප්‍රතිලාභ සහ ආවරණයන්, අලියාන්ස් ෆැමිලි ප්‍රොටෙක්ටර් ඔප්පුව සම්බන්ධයෙන් වන සංක්ෂිප්තයක් පමණක් වන අතර සියළුම නියමයන්, කොන්දේසි සහ බැහැර කිරීම් අලියාන්ස් ෆැමිලි ප්‍රොටෙක්ටර් රක්ෂණ ඔප්පුව ප්‍රකාර වේ.